1 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 1 - இல. 4
**Volume 1 - No. 4**

2016 දෙසැම්බර් 10 වන සෙනසුරාදා
2016 டிசம்பர் 10, சனிக்கிழமை
**Saturday, 10th December, 2016**

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය

## නිල වාර්තාව

# அரசியலமைப்புச் சபை

## அதிகார அறிக்கை

# CONSTITUTIONAL ASSEMBLY

## OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය
## அரசியலமைப்புச் சபை
## CONSTITUTIONAL ASSEMBLY

***2016 දෙසැම්බර් 10 වන සෙනසුරාදා***

*2016 டிசம்பர் 10, சனிக்கிழமை*

*Saturday, 10th December, 2016*

**පූ.භා.9.00ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය රැස් විය.**
**සභාපතිතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

அரசியலமைப்புச் சபை மு.ப.9.00 மணிக்குக் கூடியது.

தவிசாளர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Constitutional Assembly met at 9.00 a.m.,
THE CHAIRMAN [ HON. KARU JAYASURIYA] in the Chair.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! වාර්තා පිළිගැන්වීම.

පාර්ලිමේන්තුව සහ පළාත් සභා අතර සබඳතා පිළිබඳව සොයා බැලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කාරක සභාව විසින් පත් කරන ලද තත්කාර්ය අනුකාරක සභාවේ වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ සභාපති ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් පිළිගැන්වීම.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුව සහ පළාත් සභා අතර සබඳතා පිළිබඳව සොයා බැලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කාරක සභාව විසින් පත් කරන ලද තත්කාර්ය අනුකාරක සභාවේ වාර්තාව මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට මම පිළිගන්වමි.

ගරු සභාපතිතුමනි, අපි අනුකාරක සභා හතක වාර්තා මෙම සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එබැවින්, අපි මේ වාර්තා ගැන අපේ සාමාජිකයන්ගේ -පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ- අදහස් ලබා ගැනම සඳහා 2016 ජනවාරි මස 09වැනි දින වෙන් කර තිබෙනවා. එසේ අදහස් ලබා ගැනීම අපේ මෙහෙයුම් කමිටුවේ වැඩ කටයුතුවලට විශේෂයෙන්ම වැදගත් වෙනවා. මොකද, අපේ අනුකාරක සභාවලට වැදගත් කාරණා, විෂයයන් ගණනාවක් ඇතුළත් වෙලා තිබෙන නිසා.

මෙම අනුකාරක සභාවේ සාමාජිකයන් ලෙස අපේ ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමාත්, ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාත්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මැතිනියත් පත් කළා. මෙම අනුකාරක සභාවට ආණ්ඩුකාරවරුන්, මහ ඇමතිවරුන් හා පළාත් සභාවලින් පත් කළ නියෝජිතයන් විසින් කරන ලද ඉදිරිපත් කිරීම් මත මෙම වාර්තාව සම්පාදනය කර තිබෙනවා. මෙතැන විවිධ පක්ෂ තිබෙනවා. ඒ අයගේ අදහස් අරගෙන, ඊළඟ වාර්තාවත් ඉදිරිපත් කරන්නට අපට පුළුවන්.

අපි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන මේ අවස්ථාවේදී මේ කාරණා ගැන අදහස් දැනගන්නට අප දින දෙක-තුනක් වෙන් කර තිබෙනවා. ඒ එක්කම, ඊළඟ වාර්තා සකස් කළාම, යළිත් අපට මේ සභාවේ අදහස් ලබා ගන්නට පුළුවන්. මම හිතන විධියට මේ සභාවේ අදහස් පමණක් නොවෙයි, එවැනි අවස්ථාවකදී අපට ප්‍රධාන පක්ෂවලත් අදහස් ලබාගන්නට සිදු වනවා. ඒ වාද-විවාද තුළින් අදහස් ලබා ගෙන, මෙහි වැඩ කටයුතු කරන්නට අප බලාපොරොත්තු වනවා.

මේ දක්වා මේ අනුකාරක සභාවලට පැමිණ සාක්ෂි ඉදිරිපත් කළ අයට, මේ අනුකාරක සභාවලට උදවු කළ අයට -නිලධාරින්ට- ඒ වාගේම මේ අනුකාරක සභාවල සාමාජිකයන් සියලු දෙනාටම මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි.

ඊළඟට ගරු සුමන්තිරන් මැතිතුමා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Chairman, on the last occasion when the Constitutional Assembly convened, at the adjournment, it was announced that today, an Interim Report of the Steering Committee would also be tabled. But, it has not been tabled. As a Member of the Steering Committee, I am aware of the reasons; that several political parties wanted more discussion on the Draft Interim Report that was circulated among the Members of the Steering Committee. We are also in agreement that all political parties must have the time to discuss it among their own Members. Thereafter, that Interim Committee Report will also be tabled before this Assembly. I only hope that before we discuss it in full in this Assembly, that Draft Interim Report also can be looked into, changes made if necessary, and tabled in this Assembly.

Thank you.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු සභාපතිතුමනි, මෙහෙයුම් කාරක සභාවේ වාර්තාව සලකා බැලීමටත්, ඒ ගැන විවාදය නියම කර ගැනීමටත් තමයි මේ සභාව අද රැස්වීමට නියමිතව තිබුණේ. මෙහෙයුම් කාරක සභාවට ඉදිරිපත් වූ විවිධ අනුකාරක සභා වාර්තා තුළ වෙනත් මත දැරීම් සඳහන් නොවන බව අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු අපට කියනවා. “වෙනත් මත” කියන්නේ මෙයයි: එතැන බහුතර මතයට වෙනස්ව මත ඉදිරිපත් කරපු අපේ මන්ත්‍රීවරුන්ගේ එම මත, එම අදහස්, ඒ වාර්තාවල කිසියම් ආකාරයකට අඩංගු කර නැති බවට අපේ මන්ත්‍රීවරු පැමිණිලි කරනවා. සාමාන්‍යයෙන් අපි අනුකාරක සභා පත් කළාම කරන්නේ වෙනත් මතත් එම වාර්තාවල ඇතුළත් කරන එකයි. ඒවා ඇතුළත් කරන්න වාර්තාවේ යම් තැනක් සොයා ගන්නවා. ඒකේ ප්‍රධාන අදහස ඉදිරිපත් කරන අතර, බහුතරය වෙනත් මත තිබෙන ඒවා ඇතුළත් කරන්නත් අවස්ථාවක් තිබිය යුතුයි; ඒ අදහස් වාර්තාගත විය යුතුයි. ගරු සභාපතිතුමනි, ඔබතුමා වුණත් ඒකට එකඟ වෙනවා ඇති. අපේ සම්ප්‍රදාය, අපේ පරිචය ඒකයි. අගමැතිතුමා මේ පිළිබඳව අපට යමක් කිව්වොත් හොඳයි.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ඊළඟට එන්නේ අනුකාරක සභාවල වාර්තා ඒකාබද්ධ කරනු ලැබූ මෙහෙයුම් කමිටුවේ වාර්තාව ද, අනුකාරක සභාවල ඒ විවිධ යෝජනා කොහොමද මෙහෙයුම් කාරක සභාව ඉදිරිපත් කරන්න බලාපොරෙත්තු වෙන්නේ, ඒවායේ තිබෙන විවිධත්වයත් එක්කද, නැත්නම් ඒවායේ යම් තෝරා ගත් අදහස් මුල් කරගෙන ද යන කාරණා ගැන මම අගමැතිතුමාගෙන් දැනගන්න කැමතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි. අපි ගරු අගමැතිතුමාට අවස්ථාව දෙමු.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම අනුකාරක සභා වාර්තා ගරු සභාවට ඉදිරිපත් කරන්න අපි තීරණය කළා. එම වාර්තාවල මොකක්ද හරි, මොකක්ද වැරදි, මොකක්ද පිළිගන්නේ, මොකක්ද පිළි නොගන්නේ කියලා කියන එක අපේ යුතුකම නොවෙයි. ඒවා පිළිබඳව මෙම සභාවේ අදහස් ලබා ගත්තාට පසුව, එම වාර්තා ගැන යම් කිසි ඇගයීමක් කරන්න අපට පුළුවන්. ඒකත්, අපි එම වාර්තා ඉදිරිපත් කළාමයි කරන්න පුළුවන් වන්නේ. ඉන්පසුව ඒකට අපි එකඟ වෙනවාද නැද්ද කියලා මේ ගරු සභාවේදී කියන්න පුළුවන්.

මෙහි විවිධ මත තිබෙනවා. දැනට සමහර තැන්වල පරස්පර විරෝධී යෝජනාත් තිබෙනවා. අද මේ වාර්තාවයි, අන්තර් වාර්තාවයි ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වුණා. ඒත් අන්තර් වාර්තාව ඉදිරිපත් කිරීමට තව කල් දෙන්න කියලා ඉල්ලීමක් කළා. ඒ වාගේම, මත දෙකක් තිබුණා. එනම්, දැන් අන්තර් වාර්තාව දීලා, අපි මේ ගැනත් සාකච්ඡාවට භාජනය කරනවාද, නැත්නම් මේ අනුකමිටු වාර්තා ගැන නිදහස්ව විවාදයක් ඇති කරලා ඒ අදහසුත් ගොනු කරගෙන අපේ අන්තර් වාර්තාව ඉදිරිපත් කරනවාද කියලා. රජයේ ස්වභාවය, ආගම, ඉඩම් - මූලිකත්වයක් මෙහි තිබෙනවා- විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, ඡන්ද ක්‍රමය වැනි දේවල් කෙරෙහිත් අපේ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන් වනවා. අපි මෙහෙයුම් කාරක සභාව ජනවාරි මස පස් වෙනිදා සහ හය වෙනිදා මුණ ගැහෙන්න බලාපොරොත්තු වනවා. එම නිසා, මේ ගැන අපේ අවසන් තීරණය අරගෙන, ගරු සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්. නැත්නම්, අපි තව අවස්ථාවක ඒ වාර්තා ලබා දෙන්නම්.

දෙවනුව, සමහර විට මේ වාර්තා තුළ සුළුතරයේ වාර්තා ඇතුළු වෙලා තිබෙනවා. ඊයේ කණ්ඩායමක් ඇවිල්ලා කිව්වා, ඒ ගොල්ලන් කරුණු ඉදිරිපත් කළාට ඒවා වාර්තාවට ඇතුළත් වී නැහැ කියලා. අපි කිව්වා, යම් කිසි අදහසක් ඉදිරිපත් කරන්න තිබෙනවා නම් ජනවාරි මස 5 වන දා ඉදිරිපත් කරන්න කියලා. අපට කල් තිබෙනවා ලබන මස 9වන දාට ඒ කරුණු සාකච්ඡා කරන්න. මෙහෙයුම් කාරක සභාව ලබන 5වන දා මුණ ගැහුණාම අපි ඒ ගැන තීරණයක් ගන්නයි ඉන්නේ. එවැනි විවිධ මත ඉදිරිපත් කරන එක අපට ප්‍රශ්නයක් නොවෙයි. මේ කමිටුව තුළ විතරක් නොවෙයි, මේ මුළු පාර්ලිමේන්තුව තුළම ඒ විධියට කටයුතු කරන්න පුළුවන්. ඇමෙරිකන් ක්‍රමය අනුව බහුතර මතයයි, සුළුතර මතයයි දෙකම තියෙන්න ඕනෑ. දැන් හිතන්නේ බහුතර මතය විතරයි, සුළුතර මතය නැහැ කියලායි. අපට මේ පාර්ලිමේන්තු සභාව තුළ එක කාරණයකුත්, මෙහෙයුම් කමිටුවේ තව එකකුත් කරන්න බැහැ. මම නම් කියන්නේ, පාර්ලිමේන්තු සභාව සහ මෙහෙයුම් කමිටුව යන දෙකේම බහුතර මතය මේකයි, සුළුතර මතය මේකයි කියලා ඒ දෙකම දමලා වාර්තා කරන එකයි කරන්න තිබෙන්නේ. නඩු තීන්දුවක වුණත් බහුතර මතයයි, සුළුතර මතයයි දෙකම තිබෙනවා. මේ රටේ ජනතාවට විවිධ මත දැරීමේ අයිතියක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Leader of the Opposition.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Mr. Chairman, may I have your permission to make a short intervention? We appreciate that the Hon. Prime Minister has tabled in Parliament, today, the Report of the Ad hoc Subcommittee. This has been in addition to the Reports of the six Subcommittees that were tabled earlier and hopefully, there will be a Report from the Steering Committee, which will be submitted to this Constitutional Assembly shortly.

I believe, Sir, the debate in regard to the Reports which have been tabled before the Constitutional Assembly will commence on the $9^{th}$ of January and we look forward to that debate.

I believe that debate will continue also in relation to the Report that will be submitted by the Steering Committee and we are endeavouring to arrive at a consensus. We are having discussions with all political parties. In fact, we were happy to have a discussion yesterday with His Excellency Mahinda Rajapaksa, former President of this country and some of his colleagues. We are endeavouring to make everyone understand the need to forge a Constitution on the basis of a consensus with the maximum participation of all political parties and people who live in this country.

It is our sincere hope that it will be approved by a two-thirds majority both by this Constitutional Assembly and by Parliament and it is also our view that all the people in this country, in the exercise of their sovereign power - the sovereignty is vested in the people - will also at a referendum approve of the Constitutional proposals and give this country a new Constitution and a new future. Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Thank you, Hon. Leader of the Opposition.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මෙහෙයුම් කමිටු සාමාජිකයන් හැටියට ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙනුයි අපි කටයුතු කරන්නේ. මම සඳහන් කරන්න කැමැතියි, ඒ පිළිබඳ වැරැදි මතයක් ඇති විය යුතු

නැහැ කියලා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා ඒ කාරණය සඳහන් කළා. අගමැතිතුමා ඒකට පිළිතුරක් දුන්නා. අපේ කණ්ඩායමේ මන්ත්‍රීවරුන් අනුකාරක සභාවලදී ඉදිරිපත් කරන ලද අදහස් හා කරුණු සැලකිල්ලට ගෙන ඒ වාර්තාවේ සටහන් වී නොමැති නිසා, ඒ අයගේ අදහස් අන්තර්ගත කෙටි වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව දන්වා තිබුණා. නමුත් ඒ අවස්ථාව ලබා දීලා තිබුණේ නැහැ. කාලය පිළිබඳ හේතුව පමණයි සඳහන් කළේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්නේ රටක මුළුමහත් අනාගතය වෙනුවෙන් මිසක් හදිසියේ -කාලය අනුව- නොවෙයි. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මෙවැනි කටයුත්තකදි වගකීමෙන් කටයුතු කරනකොට එයට වගකීමෙන් ප්‍රතිචාර දැක්වීමත් ඉතාම වැදගත් වනවා. දෙවැනි කාරණය මෙයයි. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කියපු "Draft Report is ready. It has to be presented," කියන කථාවට මා එකඟ වෙන්නේ නැහැ. Sir, the Draft Report has not been approved by the Steering Committee. That is the truth.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Member, you had your chance. So, please allow me to say what I have to say.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dinesh Gunawardena, you can go ahead.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You can disagree with me. I do not care.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dinesh Gunawardena, please go ahead. I have given you the Floor.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. M.A. Sumanthiran, let him finish. The Hon. Prime Minister will also speak.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I am not agreeable to one Member taking over the entire Steering Committee.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sumanthiran, let him finish.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You cannot speak on behalf of the Steering Committee here. The Steering Committee is headed by its Chairman. The Chairman explained the situation very well.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, we have a time constraint. Please go ahead and explain.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, there is no Report.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
You can say what you want to say and I will allow the Hon. Prime Minister to reply and the Hon. M.A. Sumanthiran will also reply.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, the Hon. Prime Minister explained it very well. We do not want the others to explain on behalf of the Steering Committee. That is why I had to get up. කරුණාකරලා ගරු සභාපතිතුමනි, - The Steering Committee has not deliberated on a final Report. That is the fact. Let the country know that because we need not have an unnecessary haste and demand of the impossible being pushed on the country as a result of this Steering Committee or the Constitution. We are discussing every aspect of it. That is why we are participating in the discussions. Otherwise we do not have to participate. If we are trying to demand and push for the impossible-

මම ඉතාම පැහැදිලිව ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් කියනවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු කණ්ඩායම ඊයේ අග්‍රාමාත්‍යතුමාව හමු වෙලා මේ සම්බන්ධව

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කරුණු රාශියක් සඳහන් කළ බව. එතැන විපක්ෂ නායකතුමාත් හිටියා. බොහොම සුහද සාකච්ඡාවක් ඇති වුණා. එහිදී අපේ අදහස් අපි කිව්වා. එම නිසා කලබල වෙන්න ඕනෑ නැහැ. දැනට Interim Report එකක් නැහැ.

That is all what I have to say. I think, that is the correct fact. Whatever is coming will have to be discussed and agreed upon before it is presented.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Sumanthiran. Hon. Member, please note that we have a time constraint.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I do not want to be misunderstood. I do not want to be misrepresented also. I did not say that there was a Draft to be presented. I said there was a Draft that has been given to all political parties. All political parties want time to consider it. We also think it is necessary. And after they consider it, I did say that "with necessary changes", after all agree only, it has to come. Otherwise, it could have been presented today. So, I do not want it to be misrepresented. What I said was, it is very important -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
It is very clear, Hon. Member.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I do not want the country to be told that some people are in haste trying to shove things down other people's throat. No. None of that sort. I only said that a draft has been -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, your point is taken. Thank you very much. Hon. Rauff Hakeem, please.

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
Sir, on this issue of the Steering Committee Report, I mean it is true that it is a Draft Report, and it is yet to be discussed. We will finally, hopefully, present a complete Report by 9th of January.

But, in the meantime, we must also acknowledge the fact that this Chamber cannot be divorced from what is happening outside and certain happenings are symptomatic of the old times. So, because of these incidents, we find that there appears to be an impression that the effort that had been put in by all of us during the last several months in trying to formulate a new Constitution for the country- what its future is going to be.

So in this regard, I think we must bear in mind - since the Hon. Dinesh Gunawardena seems to have been very harsh on the Hon.Sumanthiran - I must very humbly say that some of the Party Leaders do not have the time to be putting together its deliberations. Because nothing has been imposed on us. Everyday, every time we meet, we go through word by word and are able to deliberate within the Steering Committee and come to a conclusion. But, it is unfair when some Members have put in a little more time to assist the entire Steering Committee to formulate the Final Draft, we must also recognize that they are putting in some valuable time to assist us, since they know about Constitution and they have had some expertise in Constitution drafting. Similarly, the Hon. (Dr.) Jayampathy Wickramaratne too has come in for some unwanted criticisms and finally he has also received death threats from some quarters.

I mean these are symptomatic of what is happening outside the House. So, these xenophobic forces are suddenly raising their head and trying to create unnecessary racial tension in the country. So, all of us, as responsible Leaders, will have to realize that we have a mandate and we have to fulfill that mandate. But, in trying to fulfill that mandate, we need to carry the entire country with us. There is no doubt about it. But in the meantime, this xenophobia and unnecessary fear-mongering also has to be stopped by all responsible leaders.

I am glad that the Hon. Prime Minister and the Hon. Leader of the Opposition has had discussions with the former Presidents. The two former Presidents are to be met and discussed with. Similarly, we must be thankful to the current President, His Excellency Maithripala Sirisena. He has always been very forthright in this regard that he will respect the mandate of the people and I hope that we will all together, collectively introduce a new Constitution.

So, I just wanted to add those comments about what is happening.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Thank you very much, Hon. Minister. The Hon. Mano Ganesan.

**ගරු මනෝ ගනේසන් මහතා (ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා )**
(மாண்புமிகு மனோ கணேசன் - தேசிய சகவாழ்வு, கலந்துரையாடல் மற்றும் அரசகரும மொழிகள் அமைச்சர்)
(The Hon. Mano Ganesan - Minister of National Co-existence, Dialogue and Official Languages)

ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කාරක සභාව තුළ ඒකාබද්ධ විපක්ෂය කරන කාර්ය භාරය මා ඉතා අගය කරනවා. ඒ වාගේම රවුෆ් හකීම් ඇමතිතුමා සඳහන් කළ පරිදි සුමන්තිරන් මන්ත්‍රීතුමාත්, ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් මේ කටයුත්තේදී විශාල කාර්ය භාරයක් කර ගෙන යනවා. නමුත්, අපි කවුරුත් Interim Report එක සම්පූර්ණ කරලා නැහැ. ඇත්ත වශයෙන්ම දමිළ ප්‍රගතිශීලී සන්ධානය හැටියට උතුරු නැඟෙනහිර ජීවත් වන දෙමළ ජනතාවගේ මතය අපි මේ සඳහා ඇතුළු කරන්න ඕනෑ. ඒ කටයුත්ත තවම අවසන් වෙලා නැහැයි කියන එක අපි කියනවා. එම නිසා ලබන පස්වෙනිදා හෝ හයවෙනිදා උතුරු නැඟෙනහිර ජීවත් වන දෙමළ ජනතාවගේ මතයත් මේ වාර්තාවට ඇතුළු කරලා තමයි ආපහු අපට රැස්වන්න තිබෙන්නේ.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාව ඊයේ මට හමු වුණා. අපි සාකච්ඡා කළා. මම එතුමාට කියලා තිබුණා, දැන් තිබෙන භාෂා ප්‍රතිපත්තිය තවත් වැඩිදියුණු කරන්න බලාපොරොත්තුවෙන් සිටිනවා කියලා. ඒ සම්බන්ධයෙන් එතුමාගේ මතයක් ගිය සුමානයේ ඉදිරිපත් වුණා. එතුමා ඒක නිවැරදි කර ගත්තා. එතුමා කිව්වා, එහෙම මතයක් නැහැ කියලා.

භාෂා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් පිළිඅරගෙන තිබෙනවා, වැඩි දියුණු කරනවා කියන එකයි එතුමා කිව්වේ. එතුමා සතුටුදායක ප්‍රකාශයක් කළා. ඒ නිසා අපි එකට වැඩ කරමු. මොකද, ජාතික ප්‍රශ්නය අවසන් කරන්න ඕනෑ. ඒ වාගේම මැතිවරණ ක්‍රමය ගැනත් අපි ඉතා උනන්දුවෙන් බලාගෙන ඉන්නවා. මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න යනවා කියා තිබෙනවා. හැබැයි, දැනට තිබෙන මැතිවරණ ක්‍රමය නැති කරන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. අපි ඒ සඳහා එකඟ වෙන්නේත් නැහැ. අපි ඒතැන ඉන්නවා. ඒ නිසා අපි එකට වැඩ කරමු, එහි කිසිම ප්‍රශ්නයක් නැහැ. ලබන අවුරුද්දේ අපේ ආණ්ඩුවට දෙවන වසර සම්පූර්ණ වන අවස්ථාවේදී අපට වඩාත් ප්‍රගතිශීලී තැනකට එන්න පුළුවන් වෙයි කියා හිතනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

බොහොම ස්තුතියි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු සභාපතිතුමනි, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ඊට අනුකූලව පූ.භා. 9.24ට, 2017 ජනවාරි මස 09 වන සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி மு.ப. 9.24 மணிக்கு அரசியலமைப்புச் சபை, 2017 ஜனவரி 09ஆந் திகதி, திங்கட்கிழமை மு.ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*Constitutional Assembly adjourned accordingly at 9.24 a.m. until 10.00 a.m. on Monday, 09th January, 2017.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.